# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

10 ශ්‍රේණිය | නර්තනය | 21 - සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක ආකෘති නිර්මාණය

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් අවුල්හැරය වූ කලී,

1) හිසට පළඳින්නකි  2) අතට පළඳින්නකි
3) පයට පළඳින්නකි  4) පපුවට පළඳින්නකි

02) උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි,

1) සිඛා බන්ධනය, හගල, රතු රෙද්ද
2) උල්උඩය, හගල, හැඩකැල්ල
3) උල්උඩය, දෙවල්ල, රතු කුට්ටම
4) සිඛා බන්ධනය, උල්උඩය, බුබුලු පටිය

03) ''උල් උඩය'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

1) ශාන්තිකර්ම ශිල්පීන්ගේ ආභරණයකි
2) ශාන්තිකර්ම ශිල්පීන් විසින් අඳිනු ලබන රෙද්දකි.
3) ශාන්තිකර්ම සැරසිල්ලකි.
4) ශාන්තිකර්මයට අදාළ පූජා භාණ්ඩයකි.

04) දේශීය රංග වස්ත්‍ර නිර්මාණයේ දී බහුල වශයෙන් යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය වන්නේ,

1) ලෝහ, පබලු, දැව  2) රෙදි, ලෝහ, පබලු
3) නූල්, දැව, ලෝහ  4) රිජිෆෝම්, නූල්, රෙදි

05) උඩරට සම්ප්‍රදායේදී හිසවෙස් තැබීමට ප්‍රථම ආධුනික ශිල්පීන් අඳිනු ලබන රංග වස්ත්‍රාභරණ කට්ටලය කුමක් ද?

1) උඩැක්කි ඇඳුම් කට්ටලය  2) පන්තේරු ඇඳුම් කට්ටලය
3) වෙස් ඇඳුම් කට්ටලය  4) නෛයන්ඩි ඇඳුම් කට්ටලය (තනිකච්චි)

06) වෙස් ඇඳුම් කට්ට්ලයට සාපේක්ෂව තෙල්මේ ඇඳුම් කට්ටලෙයහි විශේෂත්වය වන්නේ,

1) රෙදි භාවිතය  2) ලෝහ භාවිතය
3) පබලු භාවිතය  4) දැව සහ නූල් භාවිතය

07) රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කිරීමේ දී ප්‍රථමයෙන්ම කළ යුත්තේ,

1) එහි හැඩය, ප්‍රමාණය, ආකෘතිය, පළඳින ස්ථානය හඳුනා ගැනීමයි.
2) අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමයි.
3) රූප සටහනක් ඇඳ ගැනීමයි.
4) කැටයම්, සැරසිලි ආදිය කෙරෙහි පුහුණුවක් ලැබීමයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

08) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටල තුන නම් කරන්න.

09) දේශීන නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලවලට අමතරව ඇති තවත් රංග වස්ත්‍රාභාරණ කට්ටල දෙක බැගින් නම් කරන්න.

10) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන රංග වස්ත්‍රාභාරණ කට්ටලයේ කොටස් නම් කරන්න.

11) එහි කොටස් දෙකක් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

12) වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් 02 ක් ඇඳ නම් කරන්න.

13) මෙම රංග වස්ත්‍රාභරණ නිර්මාණයට සඳහා ගනු ලබන අමුද්‍රව්‍ය පහක් නම් කරන්න.

14) පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයේ කොටස් 03 ක් නම් කරන්න.

15) සබරගමු පබලු ඇඳුම් කට්ටලයේ කොටස් 03 ක් නම් කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සැකසුම:- නවමල් ජයවීර මයා